(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 9(3).]

# පාර්ලිමේන්තුවේ අංක 9 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2013 අගෝස්තු මස 23 වැනි සිකුරාදා**

## 2013 සැප්තැම්බර් මස 03 වැනි අඟහරුවාදා
## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (2) වැනි ව්‍යවස්ථාව සහ 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2013 අගෝස්තු 01 දිනැති අංක 1821/40 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.08.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමා,— ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නිවේදනය,— සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(4) වැනි වගන්තිය යටතේ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජූලි 15 දිනැති අංක 1819/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.08.21 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

***** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.*

## 2013 ඔක්තෝබර් මස 08 වැනි අඟහරුවාදා
## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2605/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට ජාත්‍යන්තර වරාය ව්‍යාපෘතිය අවසන්කර ක්‍රියාකාරී වරායක් ලෙස ආරම්භ වූ දිනය කවරේද;

(ii) හම්බන්තොට වරායේ වත්මන් සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) එම සේවක මණ්ඩලයට හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් බඳවා ගෙන ඇති සංඛ්‍යාව කොපමණද;

(iv) හම්බන්තොට වරායට බඳවා ගැනීමට අපේක්ෂිත මුළු සේවක සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2946/'12

ගරු රවී කරුණානායක මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2010, 2011 හා 2012 යන වර්ෂවලදී,

(i) අයවැයෙන් උසස් අධ්‍යාපනය සඳහා වෙන් කරන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) උසස් අධ්‍යාපනය සඳහා වැයවූ තථ්‍ය මුදල කොපමණද;

(iii) උක්ත මුදල් ප්‍රමාණයන් තථ්‍ය ලෙසින් වැයකරන ලද්දේ කිනම් වැය ශීර්ෂයක් යටතේද;

(iv) උසස් අධ්‍යාපනය සඳහා මාසිකව වැය කරන ලද මුදල් ප්‍රමාණය හා එම මුදල් පැවරූ ශීර්ෂයන් කවරේද;

(v) අයවැයෙන් උසස් අධ්‍යාපනය සඳහා වෙන් කරන ලද මුදල් පවරනු ලැබූ අයවැය ශීර්ෂයන් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2988/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දැරණියගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාලිබොඩ ග්‍රාම නිලධාරී වසම තුළ පිහිටි, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත්, සමනල අඩවිය ස්වාභාවික රක්ෂිතයේ පිහිටි ඇලිහත නමැති දිය ඇල්ල යොදා ගෙන මෙගා වොට් තුනක ධාරිතාවයකින් යුත් කුඩා ජල විදුලි බලාගාරයක් ඉදිකරන බවත්;

(ii) එම ඉදිකිරීම පාරිසරික අණපනත් උල්ලංඝනය කරමින් සිදුකරන බවත්;

(iii) එම ජල විදුලි බලාගාරය ඉදිකිරීම නිසා දැඩි පාරිසරික හානියක් සිදුවන බවට පරිසරවේදීන් චෝදනා නගන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ජල විදුලි බලාගාරය ඉදිකිරීම සඳහා නීත්‍යානුකූල අවසරය ලබා ගෙන තිබේද;

(ii) එය ඉදිකරනු ලබන පුද්ගලයාගේ හෝ ආයතනයේ නම කවරේද;

(iii) සිදුවන පාරිසරික හානිය සලකා බලා එම විදුලි බලාගාරයේ ඉදිකිරීම් කටයුතු නවතා දැමීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3356/'12

ගරු පී. හැරිසන් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනය යටතේ ඇති රජයේ වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) එම ආයතනවල රජයේ වාහන ලබාදී ඇති නිලධාරීන් අයත් ශ්‍රේණි කවරේද;

(iv) එම නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උක්ත අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල ඇති කුලී පදනම මත ලබාගත් වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහනවලට ගෙවීම් කරන ආකාරය කවරේද;

(iii) එම වාහන වෙනුවෙන් වාර්ෂිකව ගෙවන මුළු මුදල කොපමණද;

(iv) කුලී පදනම මත ලබාගත් වාහන පරිහරණය කරනු ලබන නිලධාරීන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත අමාත්‍යාංශය යටතේ ඇති රජයේ වාහන, කුලී පදනම මත ලබාගත් වාහන සහ නිලධාරීන්ගේ පුද්ගලික වාහන වෙන්කර හඳුනාගැනීමේ ක්‍රමවේදයක් තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්නේද;

(iii) අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවලට අයත් රජයේ වාහනවල රාජ්‍ය ලාංඡනය සමඟ අදාළ ආයතනයේ නම සඳහන් කර තිබේද;

(iv) නොඑසේ නම්, එයට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3408/’13

ගරු අජිත් කුමාර මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ධීවර යාත්‍රා, ධීවර යාත්‍රා නිෂ්පාදනය කරන ද්‍රව්‍ය, ධීවර යාත්‍රා එන්ජින්, දැල් වර්ග හා දැල් ආම්පන්න නිපදවීමේ ද්‍රව්‍ය සහ වෙනත් ධීවර ආම්පන්න ආනයනයේදී අයකරනු ලබන බදු වර්ග කවරේද;

(ii) ඉහත එක් එක් අයිතමය වෙනුවෙන් අයකරනු ලබන බදු වර්ගවල ප්‍රතිශතයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3576/’13

ගරු සුජීව සේනසිංහ මහතා,— තැපැල් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) තැපැල් සේවාව ජාල ගතකිරීම සඳහා රුපියල් කෝටි 30කට අධික මුදලක් වැය කර ඇති බවත්;

(ii) එම ව්‍යාපෘතියට ලබාගත් පරිගණක හා උපාංග වර්ෂ 5ක් තිස්සේ ප්‍රයෝජනයට ගෙන නොමැති බවත්;

(iii) මිලදී ගත් පරිගණකවල වගකීම් කාලය මේ වන විට ඉක්මවා ගොස් ඇති බවත්;

(iv) එම ව්‍යාපෘතිය පවරා ඇති පුද්ගලයා දූෂණ චෝදනාවකට වරදකරු වී ඇති බවත්;

(v) ඉහත ගනුදෙනුව සම්බන්ධයෙන් තමාට දැනුමක් නැති බව සඳහන් කරමින් තැපැල්පතිවරයා වගකීමෙන් මගහැර සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත සඳහන් ව්‍යාපෘතිය වෙනුවෙන් මුලින් ලබාගත් රුපියල් කෝටි 30ට අමතරව තවත් රුපියල් කෝටි 35ක් තැපැල් දෙපාර්තමේන්තුව මගින් ඉල්ලුම් කිරීමට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3600/'13

ගරු රන්ජන් රාමනායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ගේ සුබසාධන කටයුතු පිළිබඳව සොයා බැලීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් ශ්‍රී ලංකා තානාපති කාර්යාලවලට සුබසාධන නිලධාරීන් අනුයුක්ත කර ඇති බවත්;

(ii) විදේශ රටවලදී විවිධ හිරිහැරයට හා අතවරවලට ලක්වන ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ට මෙම නිලධාරීන් වැඩිදෙනෙකුගෙන් නිසි සේවයක් නොලැබෙන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ඉහත සුබසාධන නිලධාරීන් පත්කිරීමේදී සලකා බැලූ සුදුසුකම් කවරේද;

(ii) පත්කර ඇති එම නිලධාරීන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iii) ඉහත තනතුර සඳහා ජාත්‍යන්තර නීති රීති පිළිබඳවත්, අදාළ රටේ භාෂාව හා සංස්කෘතිය පිළිබඳවත් දැනුමක් ඇති, සුදුසුකම් සහිත නිලධාරීන් පිරිසක් පත් කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3625/'13

ගරු රෝසි සේනානායක මහත්මිය,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සබරගමුව විශ්වවිද්‍යාලයේ "භූ විඥාපන" පීඨ සංකීර්ණය හා නව ක්‍රීඩා පිටියේ ඉදිකිරීම් කටයුතු සිදු කරනු ලැබූ පාර්ශ්වය කවරේද;

(ii) මේ වන විට එම ඉදිකිරීම් කටයුතුවල ප්‍රමිතිය පිළිබඳව ගැටලුවක් මතුව තිබේද;

(iii) එසේ නම් , ඒ සම්බන්ධයෙන් විමර්ශනයක් ආරම්භ කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3719/'13

ගරු අනුර දිසානායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වන විට කර්නල්, මේජර් හා වෙනත් හමුදා තනතුරු ලබා දී ඇති විදුහල්පතිවරුන්, අධ්‍යාපන පරිපාලන නිලධාරීන් ඇතුළු පාසල් අධ්‍යාපනයට සම්බන්ධ නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) අධ්‍යාපනයට සම්බන්ධ නිලධාරීන්ට යුද හමුදා තනතුරු ලබාදීමේ අවශ්‍යතාවය කවරේද;

(iii) එම තනතුරු ලබාදුන් අයගේ නම් සහ ලබාදුන් තනතුරු ඇතුළත් ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(iv) එම තනතුරු ලබා දීම සඳහා සුදුස්සන් තෝරා ගන්නා ලද පදනම කවරේද;

(v) එවැනි තනතුරු පිරිනැමීමෙන් පාසල් අධ්‍යාපනයට සිදුවන සේවාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3774/'13

ගරු විජිත බේරුගොඩ මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 1987 දී ශ්‍රී ලංකා රජය හා ඉන්දියානු රජය අතර ගරු ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිතුමන් හා ගරු රජීව් ගාන්ධි අග්‍රාමාත්‍යතුමන් විසින් අත්සන් තබන ලද ගිවිසුම් කවරේද;

(ii) එම ගිවිසුම් අත්සන් කරන ලද දිනය හා ගිවිසුම්වල අන්තර්ගත වූ කාරණා සංක්ෂිප්තව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2606/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ වූ පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාවේ ප්‍රධාන නිරීක්ෂණ හා නිර්දේශයන්හි සාරාංශයේ 67 වැනි පිටුවේ ඇති පිට පළාත්වල සේවය කරන පොලිස් නිලධාරීන්ට පරීක්ෂණ පැවැත්වීම හා අධිකරණයේ නඩු පැවරීම පිළිබඳ විශේෂඥ නීති දැනුම ලබා ගැනීමට අවශ්‍ය ප්‍රවේශයන් නොමැති බවට වන සඳහන පිළිගන්නේද;

(ii) පිට පළාත්වල පොලීසිවලට උපදේශනයට හා මඟ පෙන්වීමට නීතිපති දෙපාර්තමේන්තුවේ ඒකක පිහිටුවන ලෙස ඉහත කොමිෂන් සභාව විසින් කරන ලද නිර්දේශය ක්‍රියාත්මක කරනු ලබන්නේද;

(iii) එසේ නම්, ඒ කවර දිනක සිටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3005/'12

ගරු රවී කරුණානායක මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2010, 2011 සහ 2012 යන වර්ෂවලට අදාළව,

(i) ඖෂධ සඳහා අයවැය මඟින් වෙන්කරන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) ඖෂධ සඳහා වැය කරන ලද තථ්‍ය මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) ඉහත කී මුදල් ප්‍රමාණයන් සත්‍ය වශයෙන්ම වියදම් කරන ලද ශීර්ෂ කවරේද;

(iv) ඖෂධ සඳහා මාසිකව වියදම් කරන ලද මුදල් ප්‍රමාණය සහ ඉහත කී මුදල් පවරණ ලද ශීර්ෂ කවරේද;

(v) අයවැය මඟින් ඖෂධ සඳහා වෙන් කරන ලද මුදල් පවරණ ලද අයවැය ශීර්ෂ කවරේද;

යන්න එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3012/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා වරාය අධිකාරියේ විශ්‍රාමික හා විශ්‍රාමයාමට බලාපොරොත්තුවන සේවකයින්ගේ දරුවන් පිය - පුතු පදනම මත තාක්ෂණ හා තාක්ෂණ නොවන පුහුණු කණ්ඩායම් දෙකක් ලෙස බඳවාගෙන එම ආයතනය තුළ වර්ෂ තුනක පුහුණුවක් ලබාදී ඇති බවත්;

(ii) එම පුහුණුව ලැබූ අයට ශ්‍රී ලංකා වරාය අධිකාරිය තුළ රැකියා ලබා නොදීම නිසා ඔවුන් දැඩි අසරණභාවයට පත්ව සිටින බවත්;

(iii) එම පිරිසට රැකියා ලබා නොදී වෙනත් අයට හිතවත්කම් මත ශ්‍රී ලංකා වරාය අධිකාරියේ රැකියා ලබා දෙන බවට චෝදනාවක් ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙතෙක් රැකියා ලබා නොදීම ඉහත පුහුණුව ලැබූවන්ට කරන බලවත් අසාධාරණයක් බවත්;

(ii) එම පුහුණු ශ්‍රමිකයන්ගෙන් ප්‍රයෝජන නොගැනීම ජාතික අපරාධයක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) ශ්‍රී ලංකා වරාය අධිකාරිය පිය - පුතු පදනම මත පුහුණුව ලබා ගත් දරුවන් සඳහා කඩිනමින් සුදුසු රැකියා ලබාදීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3357/'12

ගරු පී. හැරිසන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයට අයත් ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනය යටතේ ඇති රජයේ වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) එම ආයතනවල රජයේ වාහන ලබාදී ඇති නිලධාරීන් අයත් ශ්‍රේණි කවරේද;

(iv) එම නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උක්ත අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල ඇති කුලී පදනම මත ලබාගත් වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහනවලට ගෙවීම් කරන ආකාරය කවරේද;

(iii) එම වාහන වෙනුවෙන් වාර්ෂිකව ගෙවන මුළු මුදල කොපමණද;

(iv) කුලී පදනම මත ලබාගත් වාහන පරිහරණය කරනු ලබන නිලධාරීන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත අමාත්‍යාංශය යටතේ ඇති රජයේ වාහන, කුලී පදනම මත ලබාගත් වාහන සහ නිලධාරීන්ගේ පුද්ගලික වාහන වෙන්කර හඳුනාගැනීමේ ක්‍රමවේදයක් තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්නේද;

(iii) අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවලට අයත් රජයේ වාහනවල රාජ්‍ය ලාංඡනය සමඟ අදාළ ආයතනයේ නම සඳහන් කර තිබේද;

(iv) නොඑසේ නම්, එයට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3872/'13

ගරු ශෙහාන් සේමසිංහ මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2005 වර්ෂයේ සිට මේ දක්වා වූ කාලය තුළ,

(i) අලුතින් ඉදි කරන ලද, ඉදිකෙරෙමින් පවතින, ඉදිකිරීමට යෝජිත හා වැඩි දියුණු කරන ලද ධීවර වරායන් සංඛ්‍යාව;

(ii) අලුතින් ඉදිකරන ලද නැංගුරම් පොළවල්, කරදිය හා මිරිදිය ධීවර තොටුපළවල්, අයිස් යන්ත්‍රාගාර, ශීතාගාර, යාත්‍රාංගණ හා දැල් කර්මාන්තශාලා සංඛ්‍යාව;

(iii) ධීවර කටයුතු සඳහා අලුතින් යොදවන ලද ධීවර යාත්‍රා සංඛ්‍යාව;

කොපමණද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ඉදිරි සංවර්ධන සැළසුම් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 ඔක්තෝබර් මස 09 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2619/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පවතින විරැකියා අනුපාතය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම රැකියා වියුක්තිය සඳහා ලබාදෙන විසඳුම් කවරේද;

(iii) එම විසඳුම් මගින් සපුරාගැනීමට අපේක්ෂිත ඉලක්කයන් කවරේද;

(iv) එම ඉලක්කයන් සපුරාගැනීමට ගතවන කාල වකවානුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3013/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හ/තංගල්ල පිරිමි ජාතික පාසලේ ඉගෙනුම ලබන ශිෂ්‍යයෙකු 2007 අප්‍රේල් මස 4 වැනි දින තංගල්ල බස් නැවතුම්පොලේ සිට ඔහුගේ නිවසට රැගෙන යන අතරමඟදී තංගල්ල එවකට හිටපු නගරාධිපතිවරයා විසින් බලවත් ලෙස අපයෝජනයට ලක්කර ඇති බවත්;

(ii) ඒ පිළිබඳව තංගල්ල පිරිමි ජාතික පාසලේ ශිෂ්‍ය උපදේශක ගුරු මහතාට දැන්වීමෙන් පසු තංගල්ල පොලිසියට පැමිණිලි කර ඇති බවත්;

(iii) එම පැමිණිල්ල ඉහත පොලිස් ස්ථානයේ පැමිණිලි අංක C.W.I.B 127 පිටුව 24 වන ඡේදයෙහි සටහන් කර ඇති බවත්;

(iv) එම පැමිණිල්ල අනුව එම නගරාධිපතිවරයාට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කරන මෙන් තංගල්ල නගරයේ විශ්‍රාමික පුරවැසි සංගමය ඉල්ලා සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, ඉහත පැමිණිල්ල පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3112/'12

ගරු රවී කරුණානායක මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) දේශපාලඥයින් සහ දේශපාලනයට සම්බන්ධ නිලධාරීන් විසින් මුලතිව් දිස්ත්‍රික්කයේ සමහර ඉඩම් 2010 ජනවාරි මස සිට බලහත්කාරයෙන් අල්ලාගෙන ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) බලපත්‍ර හෝ ස්වර්ණභූමි ඔප්පු මත අයිතිය පවරනු ලැබූ, බදු දුන්, අන්සතු කළ මුලතිව් දිස්ත්‍රික්කයේ රජයේ ඉඩම්වල නම්, අක්කර ප්‍රමාණය සහ වටිනාකම කොපමණද;

(ii) ඉහත ඉඩම් පැවරීමට හෝ ලබාදීමට හේතු සහ එහිදී ටෙන්ඩර් පටිපාටිය අනුගමනය නොකිරීමට හේතු කවරේද;

(iii) ඉහත (අ) හි සඳහන් ප්‍රදේශවල දශක ගණනාවක් තිස්සේ ජීවත්වන පුද්ගලයන්ට සහ අන් අයටත් ඉහත ආකාරයට ඉඩම් ලබා ගැනීමට අවස්ථාව සහ පහසුකම් ලබා දී තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ත්‍රස්තවාදීන්ට අයත්ව තිබූ ප්‍රදේශ ශුද්ධකරණය කිරීමේ මුවාවෙන් මුලතිව් දිස්ත්‍රික්කයේ වෙරළාශ්‍රිත ඉඩම් ඒවායේ නීත්‍යානුකූල හිමිකරුවන්ගෙන් බලහත්කාරයෙන් හෝ තර්ජනය කිරීමෙන් අත්පත් කර ගැනීම පිළිබඳව චෝදනාව කරුණු සහගතද;

(ii) නොඑසේ නම්, එවන් චෝදනා එල්ල වන්නේ කෙසේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3358/'12

ගරු පී. හැරිසන් මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයට අයත් ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනය යටතේ ඇති රජයේ වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) එම ආයතනවල රජයේ වාහන ලබාදී ඇති නිලධාරීන් අයත් ශ්‍රේණි කවරේද;

(iv) එම නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උක්ත අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල ඇති කුලී පදනම මත ලබාගත් වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහනවලට ගෙවීම් කරන ආකාරය කවරේද;

(iii) එම වාහන වෙනුවෙන් වාර්ෂිකව ගෙවන මුළු මුදල කොපමණද;

(iv) කුලී පදනම මත ලබාගත් වාහන පරිහරණය කරනු ලබන නිලධාරීන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත අමාත්‍යාංශය යටතේ ඇති රජයේ වාහන, කුලී පදනම මත ලබාගත් වාහන සහ නිලධාරීන්ගේ පුද්ගලික වාහන වෙන්කර හඳුනාගැනීමේ ක්‍රමවේදයක් තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්නේද;

(iii) අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවලට අයත් රජයේ වාහනවල රාජ්‍ය ලාංඡනය සමඟ අදාළ ආයතනයේ නම සඳහන් කර තිබේද;

(iv) නොඑසේ නම්, එයට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3409/'13

ගරු අජිත් කුමාර මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2006 සිට 2012 දක්වා කාල සීමාව තුළ,

(i) ශ්‍රී ලංකාව තුළ නිපදවන ලද මත්ස්‍ය ප්‍රමාණය;

(ii) එහි වටිනාකම;

(iii) දළ දේශීය නිෂ්පාදිතයේ හෝ දළ ජාතික නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස එම වටිනාකම;

කොපමණද යන්න වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2006 සිට 2010 දක්වා කාල සීමාව තුළ අපනයනය කරන ලද මත්ස්‍ය ප්‍රමාණය;

(ii) 2006 සිට 2012 දක්වා කාල සීමාව තුළ ආනයනය කළ මත්ස්‍ය ප්‍රමාණය සහ අපනයනය කළ ටින් මාලු ප්‍රමාණය;

(iii) 2006 සිට 2012 දක්වා කාල සීමාවේදී අපනයනය හා ආනයනය කළ කරවල උම්බලකඩ, ඉස්සන් සහ වෙනත් මත්ස්‍ය නිෂ්පාදන ප්‍රමාණය;

(iv) ඉහත සඳහන් එක් එක් ද්‍රව්‍යවල ආනයන වටිනාකම සහ අපනයන වටිනාකම;

කොපමණද යන්නත් වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3630/'13

ගරු රෝසි සේනානායක මහත්මිය,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) සබරගමුව විශ්වවිද්‍යාලයේ,

(i) කළමනාකරණ පීඨයේ ආචාර්යවරුන්ගේ හිඟයක් පවතීද;

(ii) එම පීඨයේ සිටින මහාචාර්යවරු සංඛ්‍යාව කොපමණද;

(iii) භූ විඥාපන පීඨයේ ආචාර්යවරුන්ගේ සහ අනෙකුත් අධ්‍යයන කාර්ය මණ්ඩලයේ හිඟයක් පවතීද;

(iv) සමාජ විද්‍යා හා භාෂා පීඨයේ ආචාර්යවරුන්ගේ හිඟයක් පවතීද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3677/'13

ගරු වික්ටර් ඇන්ටනි මහතා,— තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2005 වර්ෂයේ සිට මේ දක්වා වූ කාල පරිච්ඡේදය තුළ ජාතික පර්යේෂණ සභාව, ජාතික විද්‍යා පදනම, අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය සහ ජාතික විද්‍යා සහ තාක්ෂණ කොමිෂන් සභාව යන ආයතන මගින් කරන ලද විශේෂිත වූ කාර්යභාරයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම එක් එක් ආයතනයේ කටයුතුවලින් අත්වූ ප්‍රතිඵල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත කාල සීමාව තුළදී ශ්‍රී ලංකා නිමැයුම්කරුවන්ගේ කොමිසම මගින් දියත් කරන ලද වැදගත් වැඩසටහන් කවරේද;

(iv) එම වැඩසටහන් තුළින් අත්කර ගත් ප්‍රතිලාභ කවරේද;

(v) ඉදිරියේ දී අමාත්‍යාංශය මගින් ඉටු කිරීමට අපේක්ෂිත සේවාවන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3682/’13

ගරු නිමල් විජේසිංහ මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට නිමකර ඇති කිරිදිඹය ජලසම්පාදන ක්‍රමය පුනරුත්ථාපන හා පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ අරමුණ කවරේද;

(ii) එම ව්‍යාපෘතිය යටතේ ආවරණය වූ ප්‍රදේශ කවරේද;

(iii) එහි වැඩ අවසන් කරන ලද දිනය කවදාද;

(iv) ඉන් ප්‍රතිලාභ ලැබූ සංඛ්‍යාව කොපමණද;

(v) එම ව්‍යාපෘතිය සඳහා වැය කළ මුදල කොපමණද;

(vi) එම වැය බර දැරූ ආයතන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3721/’13

ගරු අනුර දිසානායක මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013 මාර්තු 6 වැනි දින හෝ ඊට ආසන්න දිනකදී තමිල්නාඩුවේ, මදුරෙයිහි පිහිටි මිහින් ලංකා ගුවන් සේවා සමාගමේ කාර්යාලයකට කිසියම් පිරිසක් විසින් පහරදී තිබේද;

(ii) එහිදී සිදුවූ දේපළ හානියේ වටිනාකම කොපමණද;

(iii) එම කාර්යාලයට පහරදීම පිළිබඳව විදේශ කටයුතු අමාත්‍යාංශය ගනු ලැබූ පියවර කවරේද;

(iv) ඒ පිළිබඳව ඉන්දියානු රජයෙන් පරීක්ෂණයක් කර තිබේද;

(v) එම පරීක්ෂණයේ තොරතුරු විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත දන්වා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3743/’13

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) රටෙහි පවතින බදු ක්‍රමය පිළිබඳව අධ්‍යයනය කර රජයේ ආදායම් වැඩිකිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස ජනාධිපතිතුමා විසින් 2009 වර්ෂයේ හෝ ඒ ආසන්න කාලයකදී කොමිසමක් පත්කරන ලද බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එකී කොමිසම පත්කරන ලද නිවැරදි දිනය කවරේද;

(ii) එකී කොමිසමේ සාමාජිකයින්ගේ නම් සහ ඔවුන් අනුබද්ධ ආයතන කවරේද;

(iii) එකී කොමිසමේ වාර්තාව සකස් කර අවසන් කළ දිනය සහ එම වාර්තාව ජනාධිපතිතුමා වෙත භාර දුන් දිනය කවරේද;

(iv) එකී වාර්තාව සභාගත කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එකී කොමිසම පත්කිරීමට පෙර වර්ෂයේ රජයේ ආදායම දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස කවරේද;

(ii) 2012 වර්ෂයේ රජයේ ආදායම දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3746/'13

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 6 වැනි ශ්‍රේණියේ සිට උසස් පෙළ දක්වා ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබාදෙන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද යන්න දිස්ත්‍රික් මට්ටමින්, වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උසස් පෙළ පමණක් ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබාදෙන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) රජයේ ඉංග්‍රීසි මාධ්‍ය පාසල් අධ්‍යාපනය සෑහීමකට පත්විය හැකි මට්ටමක පවතින්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3770/'13

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කලාව, සංස්කෘතිය සහ සාහිත්‍ය ප්‍රවර්ධනය කරනු පිණිස ජනාකීර්ණ කින්නියා නගරයේ සංස්කෘතික මධ්‍යස්ථානයක් පිහිටුවන ලෙස අධ්‍යාපනඥයින්, විද්වතුන් සහ ලේඛකයින් විසින් පසුගිය කාලයේ ඉල්ලීම් ගණනාවක් ඉදිරිපත් කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) ඉහත සඳහන් කළ අංශයන් සහ ජනතාවගේ අනෙකුත් ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම පිණිස කින්නියා නගරයේ එවැනි සංස්කෘතික මධ්‍යස්ථානයක් ඉදිකිරීමට අවශ්‍ය කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3912/'13

ගරු රුවන් රණතුංග මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිවිධ හමුදාවේ වෛද්‍ය සේවයෙන් නීත්‍යානුකූලව ඉවත්වූ වෛද්‍යවරුන් නැවත රජයේ වෛද්‍ය සේවයට බඳවා ගැනීමේදී සේවා පළපුරුද්ද, ශ්‍රේණිය හා ජ්‍යෙෂ්ඨත්වය නොසලකා ඔවුන් ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය තනතුරේ පිහිටුවාලීමේ අසාධාරණ ක්‍රමවේදයක් පවතින බවත්;

(ii) හමුදා සේවයෙන් ඉවත්ව තවදුරටත් රටට සේවය කිරීමට කැමති බොහෝමයක් වෛද්‍යවරුන්ගේ රට හැරයෑමට එම තත්ත්වය හේතුවී ඇති බවත්;

(iii) එවැනි තත්ත්වයක් යටතේ වුවද, රජයේ වෛද්‍ය සේවයට ඇතුළත්වූ වෛද්‍ය එම්. ඩී. ඩබ්ලිව්. ලොකුගේ ඇතුළු වෛද්‍යවරුන් ගණනාවක් මේ වනවිට බලවත් අසාධාරණයකට ලක්වෙමින් ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ශ්‍රේණිය පහත හෙළා එම වෛද්‍යවරුන් රජයේ වෛද්‍ය සේවයට බඳවා ගැනීම හමුදා සේවය යටතේ ඔවුන් රටට කළ සේවය වරදක් සේ සලකා කරනු ලබන දඬුවම්දීමක් නොවන්නේද;

(ii) යුද්ධය පැවති අවධියේ ඔවුන් ස්වකැමැත්තෙන් ත්‍රිවිධ හමුදාවේ වෛද්‍ය බලකායට එක් වී සිදු කළ සේවය ඇගයීමට ලක් නොකිරීමට හේතු කවරේද;

(iii) එම වෛද්‍යවරුන් බඳවා ගැනීමේදී ආයතන සංග්‍රහයේ දෙවැනි පරිච්ඡේදයේ 17 වැනි වගන්තිය යටතේ දැක්වෙන අනු වගන්තීන් හා 14.4 සහ VII වැනි පරිච්ඡේදයේ 9.3 හා 9.4 වගන්තීන්ට අනුවත් දියහැකි අනුග්‍රහ ලබා නොදීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3916/'13

ගරු තලතා අතුකෝරල මහත්මිය,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2006 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා යුධ හමුදාව සඳහා කුලී පදනම මත ලබා ගෙන ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් වාහනය සඳහා ගෙවන ලද මුදල කොපමණද;

(iii) කුලී පදනම මත ලබාගත් වාහන සඳහා 2006 වර්ෂයේ සිට 2012 දක්වා වාර්ෂිකව ගෙවා ඇති සම්පූර්ණ මුදල කොපමණද;

(iv) ඉහත කාල සීමාව තුළ කුලී පදනම මත ශ්‍රී ලංකා යුධ හමුදාවේ සේවයට යොදා ගෙන ඇති වාහනවල ලියාපදිංචි අයිතිකරුවන් කවුරුන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4055/'13

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහවැලි සංවර්ධන අධිකාරියෙන් ඉඩම් ලබාදුන් මහනුවර, ගුරුදෙණිය, හාරගම ග්‍රාම නිලධාරී වසමෙහි 3 කොළණියෙහි නිවාස 130 ක වාසය කරනු ලබන ජනතාව 1983 වර්ෂයේ සිට මේ දක්වා පානීය ජල පහසුකම නොමැතිකමින් මහත් පීඩාවට පත්ව ඇති බවත්;

(ii) තම දෛනික පරිභෝජනයට ජලය ලබාගැනීම සඳහා එම ජනතාවට කිලෝමීටර් එකහමාරක දුරක් යෑමට සිදුව ඇති බවත්;

(iii) ජල සම්පාදන මණ්ඩලයේ ඇස්තමේන්තු අනුව එම ප්‍රදේශයට ජල සැපයුම ලබාදීමේ ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 36ක් අවශ්‍ය වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත සඳහන් ව්‍යාපෘතිය සඳහා මුදල් ලබා දී එකී ප්‍රදේශයේ ජනතාවට පානීය ජල පහසුකම් කඩිනමින් ලබා දෙන දිනය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2013 ඔක්තෝබර් මස 10 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2604/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ වූ පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාවේ ප්‍රධාන නිරීක්ෂණ හා නිර්දේශයන්හි සාරාංශයේ 69 වැනි පිටුවේ සඳහන් රාජ්‍ය නිලධාරීන් පත්කිරීම්, මාරු කිරීම් ආදිය සම්බන්ධයෙන් බලයේ සිටින පක්ෂයේ දේශපාලනඥයින් ඇඟිලි ගැසීම තැති ගන්වන සුළු ප්‍රපංචයක් ලෙසට කර ඇති හැඳින්වීම පිළිගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත කොමිෂන් සභාව විසින් ස්වාධීන රාජ්‍ය සේවා කොමිෂන් සභාවක් නොපමාව පත්කළ යුතු බවට දැඩි ලෙස කරන ලද නිර්දේශය ක්‍රියාත්මක කරනු ලබන්නේද;

(ii) එසේ නම්, එම කොමිසම පත් කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2933/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වල්ලිවල බටහිර ග්‍රාම නිලධාරී වසම තුළ අභිමානගම නිවාස ක්‍රමය පිහිටා ඇති බවත්;

(ii) 1985 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ ප්‍රථම නාගරික වනෝද්‍යානය ලෙස වැලිගම අභිමානගම නිවාස ව්‍යාපෘතියට ආසන්න භූමියක් ප්‍රකාශයට පත්කර ඇති බවත්;

(iii) වනෝද්‍යානය සහිත එම භූමිය 2012 මැයි 23 දින දිනමිණ පුවත්පතේ පළකරන ලද දැන්වීමක් මගින් විකිණීම සඳහා කටයුතුකර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එම නාගරික වනෝද්‍යානය විකිණීමට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2943/'12

ගරු රවී කරුණානායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2010, 2011 සහ 2012 යන වර්ෂයන්හිදී,

(i) අය-වැය තුළින් අධ්‍යාපනය සඳහා වෙන් කරන ලද අරමුදල් ප්‍රමාණය කොපමණද;

(ii) අධ්‍යාපනය වෙනුවෙන් වියදම් කරන ලද තථ්‍ය මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) එම ප්‍රමාණයන් තථ්‍ය ලෙස වියදම් කරන ලද්දේ කුමන ශීර්ෂයන් යටතේද;

(iv) අධ්‍යාපනය වෙනුවෙන් මාසිකව වියදම් කරන ලද මුදල් ප්‍රමාණය සහ එම මුදල පවරා ඇති ශීර්ෂයන් කවරේද;

(v) අය-වැය මගින් අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කරන ලද මුදල පවරනු ලැබූ ශීර්ෂයන් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3265/'12

ගරු රෝසි සේනානායක මහත්මිය,— පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මිල්කෝ සමාගමේ අඹේවෙල ශාඛාවේ කිරි ගබඩා කර තැබීමේ පහසුකම් නොමැති බව දන්නේද;

(ii) අඹේවෙල ශාඛාවේ ගබඩා පහසුකම් නොමැතිවීම නිසා කිරිපිටි නිපදවීම සඳහා ක්‍රීම් බවට පත්කර තිබියදී ඉවත් කරන ලද කිරි ලීටර් සංඛ්‍යාව කොපමණද;

(iii) එම කිරිවල වටිනාකම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) මිල්කෝ සමාගමේ මාසික ආදායම සහ ශුද්ධ ලාභය කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3349/'12

ගරු පී. හැරිසන් මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයට අයත් ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනය යටතේ ඇති රජයේ වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) එම ආයතනවල රජයේ වාහන ලබාදී ඇති නිලධාරීන් අයත් ශ්‍රේණි කවරේද;

(iv) එම නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උක්ත අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවලට කුලී පදනම මත ලබා ගෙන ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහනවලට ගෙවීම් කරන ආකාරය කවරේද;

(iii) එම වාහන වෙනුවෙන් වාර්ෂිකව ගෙවන මුළු මුදල කොපමණද;

(iv) කුලී පදනම මත ලබාගත් වාහන පරිහරණය කරනු ලබන නිලධාරීන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත අමාත්‍යාංශය යටතේ ඇති රජයේ වාහන, කුලී පදනම මත ලබාගත් වාහන සහ නිලධාරීන්ගේ පුද්ගලික වාහන වෙන්කර හඳුනාගැනීමේ ක්‍රමවේදයක් තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්නේද;

(iii) අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවලට අයත් රජයේ වාහනවල රාජ්‍ය ලාංඡනය සමග අදාළ ආයතනයේ නම සඳහන් කර තිබේද;

(iv) නොඑසේ නම්, එයට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම් ඒ මන්ද?

3412/'13

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වේරැස් ගඟ වැසි ජලය අපවහන හා පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය නමින් ව්‍යාපෘතියක් සඳහා පෞද්ගලික ඉඩම් රජයට පවරා ගැනීමට අපේක්ෂා කරන්නේද;

(ii) එකී ව්‍යාපෘතිය සඳහා අත්පත් කර ගැනීමට අපේක්ෂිත ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එකී ව්‍යාපෘතිය මගින් ඉටු කරවා ගැනීමට අපේක්ෂිත අරමුණු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) රජයට පවරා ගන්නා ඉඩම් සඳහා වන්දි ගෙවීමේදී අනුගමනය කරන ප්‍රතිපත්තිය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3441/'13

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) 2013 ජනවාරි මාසයේදී පමණ හම්බන්තොට වරාය සඳහා ඇ.ඩො. මිලියන 153 ක අතිරේක ණය මුදලක් චීනයෙන් ලබාගෙන ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ණය මුදල ලබා ගත් නියමයන් සහ කොන්දේසි (පොලී අනුපාතය, ණය ආපසු ගෙවීම සඳහා ලබා දෙන කාලය, අනෙකුත් ගාස්තු) කවරේද;

(ii) මෙම ණය මුදල ලබාගත් බැංකුව කවරේද; සහ කිසියම් දේශීය හෝ විදේශීය තැරැව්කරුවන් යොදා ගනු ලැබුවේද;

(iii) හම්බන්තොට වරාය සඳහා සියලුම මූලාශ්‍රවලින් ලබා ගෙන ඇති සම්පූර්ණ ණය මුදල එක් එක් මූලාශ්‍රයට අදාළ නියමයන් සහ කොන්දේසි ද ඇතුළුව කවරේද;

(iv) මුල් ගිවිසුම අත්සන් කරනු ලැබීමෙන් පසුව ඉහත (iii) හි සඳහන් ණය කොන්දේසි කිසිවක් කිසියම් අවස්ථාවක වෙනස්කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3513/'13

ගරු වසන්ත අලුවිහාරේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මාතලේ දිස්ත්‍රික්කයේ, උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් තිබ්බටුමුල්ල කණිෂ්ඨ විද්‍යාලය වර්ෂ කීපයක සිට වසා දමා ඇති බවත්;

(ii) එම විදුහල් භූමිය හා ගොඩනැගිලි සම්බන්ධව පළාත් සභාව හෝ මධ්‍යම රජය මෙතෙක් කිසිදු අවධානයක් යොමු නොකළ බවත්;

(iii) ඒ හේතුවෙන් ඇතැම් පිරිස් විදුහල් භූමිය අත්පත් කරගනිමින් සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) 1975 වර්ෂයේදී ආරම්භ කළ එම විදුහලට අයත් භූමි ප්‍රමාණය, ගොඩනැගිලි සංඛ්‍යාව සහ අනෙකුත් භෞතික සම්පත් කවරේද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) තිබ්බටුමුල්ල කණිෂ්ඨ විද්‍යාලය වසා දැමූ දිනය කවරේද;

(ii) එය වසා දමන අවස්ථාවේ ඉගෙනුම ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව සහ සේවය කළ ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) වසා දැමීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) වසා දමා ඇති මෙම පාසල සංවර්ධනය කර නැවත ආරම්භ කිරීමට හෝ විදුහල් භූමිය හා එහි ගොඩනැගිලි වෙනත් ඵලදායී කටයුත්තකට යොදා ගැනීමට පියවර ගන්නේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

3536/'13

ගරු ඒ. විනායගමූර්ති මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) උතුරු පළාත තුළ දෙමළ ජාතික සන්ධානය (TNA) මගින් පාලනය කරනු ලබන පළාත් පාලන ආයතනවලින් ලබාගෙන එම පළාතේ ආණ්ඩුකාරවරයාට දෙනු ලැබූ මුදල් පිළිබඳ තොරතුරු කවරේද;

(ii) පළාත් පාලන ආයතනවලින් මෙම මුදල් ලබා ගත්තේ කාගේ නියෝගය මතද;

(iii) එකී මුදල් ලබා ගැනීමට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3601/'13

ගරු රන්ජන් රාමනායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොරියානු රැකියා අවස්ථා සඳහා 2012 වර්ෂයේ පැවැත්වූ කොරියානු භාෂා විභාගයෙන් සමත් වූ අයදුම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් අතරින් 2012 වර්ෂය තුළ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හරහා කොරියානු රැකියා සඳහා පිටත්ව ගොස් ඇති ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) එසේ යවනු ලැබූ අයගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3729/'13

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) "මහින්ද රාජපක්ෂ" නාමය යොදා ඇති ශ්‍රී ලංකාවේ වරායන්, රංගශාලා, ක්‍රීඩාංගණ, පාසල්, රෝහල් ආදී ස්ථාන කවරේද;

(ii) එකී නමින් එම එක් එක් ස්ථානය හෝ ව්‍යාපෘතිය ආරම්භ කල දිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත එක් එක් ආයතනයට හෝ ව්‍යාපෘතියට වැය කරන ලද සමස්ත මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) පාසල් හා රෝහල් හැර ඉහත සඳහන් ආදායම් ලැබෙන ආයතනවලින් මෙතෙක් රටට ලැබී ඇති ආදායම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3779/'13

ගරු විජිත බේරුගොඩ මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දැනට වැඩ අවසන් කර ඇති මොරටුව/පානදුර, අඹතලේ හා මීගමුව යන ප්‍රදේශවලට ජල පිරිපහදු පහසුකම් සැපයීමේ ව්‍යාපෘතියේ අරමුණ කවරේද;

(ii) එම ව්‍යාපෘතිය මගින් ආවරණය වූ ප්‍රදේශ කවරේද;

(iii) එහි වැඩ අවසන් කරන ලද දිනය කවරේද;

(iv) ඉන් ප්‍රතිලාභ ලැබූ සංඛ්‍යාව කොපමණද;

(v) එම ව්‍යාපෘතිය සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(vi) එම මුදල් වැය කරන ලද ආයතන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3860/'13

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය,— විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය මගින් ක්‍රියාත්මක කෙරෙන ජාල සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රගතිය කවරේද;

(ii) එම ආයතනය රජයේ ව්‍යාපෘතීන් සඳහා ලබාදෙන ලද දායකත්වය කවරේද;

(iii) දැනුම පිළිබඳ වූ වටිනාකම ව්‍යාප්ත කිරීම සඳහා දරන ලද දායකත්වය කවරේද;

(iv) එම ආයතනයේ ඉදිරි සැලසුම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3862/'13

ගරු මාලනී ෆොන්සේකා මහත්මිය,— පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල වැවිලි සමාගම යටතේ පාලනය වන වතු කවරේද;

(ii) එම එක් එක් වත්තේ භූමි ප්‍රමාණය හා කරනු ලබන ප්‍රධාන වගාවන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ගතවූ ආසන්නතම වර්ෂ 10 තුළ එක් එක් වත්තෙන් ලැබූ ආදායම හා ලාභය හෝ අලාභය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3865/'13

ගරු මනූෂ නානායක්කාර මහතා,— පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්තයේ දියුණුවට අදාළව පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය පොල් වගා කරන වෙනත් රටවල් සමග අන්තර් ජාතික සබඳතාවයක් ඇති කර ගෙන තිබේද;

(ii) එසේ නම්, එවැනි සබඳතා ඇතිකර ගෙන ඇති රටවල් කවරේද;

(iii) එම එක් එක් රට සමග අවබෝධතා ගිවිසුම්වලට එළැඹ තිබේද;

(iv) එම අවබෝධතා ගිවිසුම් ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්තයට බලපාන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 ඔක්තෝබර් මස 11 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2614/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හක්වටුනාව නමින් වාරි ව්‍යාපෘතියක් තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) හක්වටුනාව වාරි ව්‍යාපෘතිය යටතේ,

(i) අස්වද්දන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

(ii) ප්‍රතිලාභ ලබන ගොවි පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) යල මහ දෙකන්නයේම වගා කටයුතු සඳහා ජලය ලබා ගැනීමට හැකියාව තිබේද;

(iv) එම හැකියාව නොමැති නම්, එසේ කිරීමට හැකිවන පරිදි හක්වටුනාව වාරි ව්‍යාපෘතිය වැඩි දියුණු කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2897/'12

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලසන්ත වික්‍රමතුංග මහතා ඝාතනය කරන ලද්දේ කවදාද;

(ii) එම ඝාතනය පිළිබඳ විමර්ශනය මෙහෙය වූ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරී කණ්ඩායම කවරේද;

(iii) මෙම කාරණය සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවෙන් අනුයුක්ත කොට සිටි නිලධාරියා කවරෙක්ද;

(iv) මෙම ඝාතනය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගනු ලැබූ පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත කී ඝාතන සිද්ධිය විමර්ශනයේදී යම් උදාසීන බවක් පවතින බවත්;

(ii) කවර හෝ හේතුවක් මත රජයට මෙම මිනීමැරුම් සිද්ධිය යටපත් කිරීමට අවශ්‍ය වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2989/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, ලාහුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පානම ශාස්ත්‍රවෙල ප්‍රදේශයේ වනාන්තර හා කෘෂිකාර්මික බිම් අක්කර 1220 ක ප්‍රමාණයක් නාවික හමුදාව හා විශේෂ කාර්ය බලකාය විසින් අත්පත්කර ගෙන තිබෙන බවත්;

(ii) එම භූමියේ රණවිරු ගම්මානයක්, නාවික හමුදා කඳවුරක් හා හෝටල් සංකීර්ණයක් ඉදිකිරීමට සැලසුම්කර ඇති බවත්;

(iii) එම භූමියෙහි පිහිටා ඇති බැලුම්කාරාරාම විහාරය ඇතුළු තවත් පුරාවිද්‍යාත්මක ස්ථානවලට ඇතුළුවීම ජනතාවට තහනම්කර ඇති බවත්;

(iv) එකී ඉඩම් අත්පත් කර ගැනීම නිසා ප්‍රදේශයේ ජන ජීවිතයට සහ ස්වාභාවික පරිසරයට දැඩි බලපෑමක් එල්ලවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ඉඩම් අත්පත්කර ගැනීම සඳහා නීත්‍යානුකූල අවසරයක් ලබාගෙන තිබේද;

(ii) එම ඉඩම් අත්පත්කර ගැනීම නිසා ඉඩම් හා දේපළ අහිමි වන ජනතාවට නැවත ඉඩම් හෝ වන්දි ලබාදීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2997/'12

ගරු රෝසි සේනානායක මහත්මිය,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2009 සිට 2012 දක්වා කාල සීමාව තුළ අධිකරණයට ඉදිරිපත්ව ඇති සමස්ත ළමා අපචාර හා අපයෝජන නඩු සංඛ්‍යාව කොපමණද;

(ii) එම නඩු අතුරින් මේ වන විට විභාග වෙමින් පවතින සංඛ්‍යාව සහ විභාග කොට අවසන් කර ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2009 සිට මේ දක්වා විභාග කළ ළමා අපචාර හා අපයෝජන නඩුවලදී වරදකරුවන් වී දඬුවම් ලැබූ සංඛ්‍යාව කොපමණද;

(ii) ළමා අපචාර හා අපයෝජන සිද්ධි සම්බන්ධයෙන් වරදකරුවන් වූවන්ට ලබා දෙන උපරිම දඬුවම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3061/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) කලුතර දිස්ත්‍රික්කයේ, හොරණ, මතුගම සහ කලුතර යන අධ්‍යාපන කලාපවලට අයත් පාසල් රැසක ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු මුදල් නොමැතිකමින් නතර කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත අධ්‍යාපන කලාප තුළ ඇති අඩක් නිමකරන ලද ගොඩනැගිලි සහිත පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා රජය විසින් වෙන්කරන ලද මුදල්වලට සිදුවූයේ කුමක්ද;

(iii) එම පාසල්වල පවතින අඩක් නිමකළ ගොඩනැගිලිවල ඉදිකිරීම් සම්පූර්ණ කිරීම සඳහා තවදුරටත් අවශ්‍යවන මුදල කොපමණද;

(iv) අදාළ මුදල් ප්‍රතිපාදන කඩිනමින් වෙන්කොට එම පාසල් ගොඩනැගිලිවල ඉදිකිරීම් සම්පූර්ණ කරදීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3351/'12

ගරු පී. හැරිසන් මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයට අයත් ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනය යටතේ ඇති රජයේ වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) එම ආයතනවල රජයේ වාහන ලබාදී ඇති නිලධාරීන් අයත් ශ්‍රේණි කවරේද;

(iv) එම නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උක්ත අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවලට කුලී පදනම මත ලබාගෙන ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහනවලට ගෙවීම් කරන ආකාරය කවරේද;

(iii) එම වාහන වෙනුවෙන් වාර්ෂිකව ගෙවන මුළු මුදල කොපමණද;

(iv) කුලී පදනම මත ලබාගත් වාහන පරිහරණය කරනු ලබන නිලධාරීන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත අමාත්‍යාංශය යටතේ ඇති රජයේ වාහන, කුලී පදනම මත ලබාගත් වාහන සහ නිලධාරීන්ගේ පුද්ගලික වාහන වෙන්කර හඳුනාගැනීමේ ක්‍රමවේදයක් තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්නේද;

(iii) අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවලට අයත් රජයේ වාහනවල රාජ්‍ය ලාංඡනය සමඟ අදාළ ආයතනයේ නම සඳහන් කර තිබේද;

(iv) නොඑසේ නම්, එයට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම් ඒ මන්ද?

3686/'13

ගරු රන්ජන් රාමනායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුවේට් රාජ්‍යයේ රැකියා සඳහා ගොස් ඇති ශ්‍රී ලාංකික කාන්තාවන් 300කට වැඩි පිරිසක් එහිදී ඔවුන්ට මුහුණපෑමට සිදුවී ඇති විවිධ තාඩන, පීඩන සහ අතවර හේතුවෙන් සේවා ස්ථානවලින් පැනයාම නිසා වෙනත් කිසිදු චෝදනාවක් නොමැතිව පොලිස් අත්අඩංගුවේ සහ සිර කඳවුරුවල රඳවාගෙන සිටින බවත්;

(ii) එලෙස කරදර හිරිහැරවලට ලක්ව සිටින ශ්‍රී ලාංකික ශ්‍රමිකයින්ගේ දුක් ගැනවිලි සම්බන්ධයෙන් සොයාබලා ක්‍රියාකිරීම සඳහා කුවේට්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයට අනුයුක්ත කර ඇති ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නිලධාරීන්ගෙන් එම ගැටලු විසඳීම සඳහා ක්‍රමවත්, කඩිනම් ප්‍රතිචාරයන් නොලැබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) දැනට ක්වේට් රාජ්‍යයේ කඳවුරුවල රඳවා සිටින පිරිස් කඩිනමින් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3775/'13

ගරු විජිත බේරුගොඩ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හදිසි නීතිය යටතේ උතුරු හා නැගෙනහිර පළාත් ඒකාබද්ධ කරනු ලැබූ දිනය කවරේද;

(ii) එසේ ඒකාබද්ධ කිරීමට තුඩු දුන් හේතු කවරේද;

(iii) එසේ ඒකාබද්ධ කරන ලද උතුරු හා නැගෙනහිර පළාත්, පළාත් දෙකක් වශයෙන් නැවත ප්‍රකාශයට පත් කරනු ලැබූ දිනය කවරේද;

(iv) එම පළාත් වෙන් කිරීම, ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුවකින් පසුව සිදුකරනු ලැබුවේද;

(v) නොඑසේ නම්, එවැනි නඩු තීන්දුවක් ලැබීමට පෙර එසේ කරනු ලැබුවේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2615/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ, දොරටියාව සිට කෝන්පල දක්වා මාර්ගය දැඩි ලෙස අබලන් වී ඇති බවත්;

(ii) එම හේතුවෙන් ප්‍රදේශවාසීන් විශාල පිරිසක් අපහසුතාවට පත්වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් මාර්ගය පිළිසකර කිරීමට පියවර ගන්නා දිනය කවරේද;

(ii) ඒ සඳහා වැයවන මුළු මුදල කොපමණද;

(iii) එම මාර්ගය පිළිසකර කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන නිදහස් කිරීමට කටයුතු කරන දිනය කවරේද;

(iv) මෙම මාර්ගය පිළිසකර කිරීම අවසන්කර ජනතාව අතට පත්කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2937/'12

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 සහ 2012 වර්ෂවලදී පවත්වන ලද ජන සංගණනය සඳහා දරන ලද සමස්ත වියදම කොපමණද;

(ii) ඉහත සංගණනයේදී තොරතුරු ලබා ගැනීම සඳහා සේවයෙහි යොදවන ලද පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(iii) සිංහල, දෙමළ, මුස්ලිම්, මැලේ, බර්ගර් සහ වෙනත් යනාදී වශයෙන් ජනවාර්ගික කන්ඩායම් පදනමින් රටෙහි ජනගහනය කොපමණද;

(iv) බෞද්ධ, ක්‍රිස්තියානි (සෑම නිකායක්ම) හින්දු, ඉස්ලාම් වශයෙන් ආගමික පදනමින් රටෙහි ජනගහනය කොපමණද;

(v) එක් එක් දිස්ත්‍රික්කයෙහි ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ජනගහන සහ නිවාස සංගණනයෙහි දත්ත සුපිරික්සීම (data scanning) පිණිස වන ප්‍රසම්පාදනය සම්බන්ධයෙන්;

(i) ප්‍රසම්පාදනය ලැබූ ලංසුකරු කවරේද;

(ii) එක් එක් ප්‍රසම්පාදනය සඳහා ඉදිරිපත් කල මිල ගණන් වෙන් වෙන්ව දක්වමින්, එම ප්‍රසම්පාදනය සඳහා මිල ගණන් ඉදිරිපත් කල අනෙකුත් ලංසුකරුවන්ගේ නම් කවරේද;

(iii) කැබිනට් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන මණ්ඩලයේ සාමාජිකයින්ගේ නම් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2990/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කෑගල්ල දිස්ත්‍රික්කයේ, කිතුල්ගල, කැලණිවැලි රක්ෂිතයට අයත් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පාලනයවන මාකන්දූව රක්ෂිතය හරහා කිතුල්ගල සිට පල්ලෙබාගෙ දක්වා මාර්ගයක් ඉදිකරනු ලබන බවත්;

(ii) එම මාර්ගය ඉදිකිරිම නිසා දැඩි පාරිසරික හානියක් සිදුවන බවට පරිසරවේදීන් චෝදනා කරන බවත්;

(iii) සිදුවන පරිසර හානිය වැලැක්විම සඳහා එම මාර්ගයේ ඉදිකිරීම් කටයුතු නතර කරන ලෙස ප්‍රදේශවාසීන් ඉල්ලා සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මාකන්දූව රක්ෂිතය හරහා ඉහත සඳහන් මාර්ගය ඉදිකිරිමට නීත්‍යානුකූලව අවසර ලබා ගෙන තිබේද;

(ii) සිදුවන පරිසර හානිය සහ ඊට අදාළ ජනතා විරෝධය සලකා එම මාර්ගයේ ඉදිකිරීම් කටයුතු නතර කිරිමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3254/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මෑතකදී ලැප්ටොප් පරිගණක ලබාදුන් ජනමාධ්‍යවේදීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ජනමාධ්‍යවේදීන්ගේ නම් ලැයිස්තුවක් ඉදිරිපත් කරන්නේද;

(iii) එම ලැප්ටොප් පරිගණක ලබාදීමට ජනමාධ්‍යවේදීන් තෝරා ගන්නා පදනම කවරේද;

(iv) එම එක් පරිගණකයක මිල කොපමණද;

(v) මේ දක්වා බෙදා දී ඇති ලැප්ටොප් පරිගණක සඳහා වැයකර ඇති සමස්ත මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3267/'12

ගරු රෝසි සේනානායක මහත්මිය,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පෞද්ගලික අංශයෙන් කොළඹ මහ නගර සභාවට අයවිය යුතු සමස්ත හිඟ වරිපනම් බදු මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) 2012 වර්ෂය වෙනුවෙන් එම නගර සභාවට අයවිය යුතුව තිබූ සමස්ත වරිපනම් බදු මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3352/'12

ගරු පී. හැරිසන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනය යටතේ ඇති රජයේ වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) එම ආයතනවල රජයේ වාහන ලබාදී ඇති නිලධාරීන් අයත් ශ්‍රේණි කවරේද;

(iv) එම නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උක්ත අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවලට කුලී පදනම මත ලබාගෙන ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහනවලට ගෙවීම් කරන ආකාරය කවරේද;

(iii) එම වාහන වෙනුවෙන් වාර්ෂිකව ගෙවන මුළු මුදල කොපමණද;

(iv) කුලී පදනම මත ලබාගත් වාහන පරිහරණය කරනු ලබන නිලධාරීන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත අමාත්‍යාංශය යටතේ ඇති රජයේ වාහන, කුලී පදනම මත ලබාගත් වාහන සහ නිලධාරීන්ගේ පුද්ගලික වාහන වෙන්කර හඳුනාගැනීමේ ක්‍රමවේදයක් තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්නේද;

(iii) අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවලට අයත් රජයේ වාහනවල රාජ්‍ය ලාංඡනය සමග අදාළ ආයතනයේ නම සඳහන් කර තිබේද;

(iv) නොඑසේ නම්, එයට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද ?

(ඈ) නොඑසේ නම් ඒ මන්ද?

2616/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ, වැල්ලව, හඳිරවලාන හරහා බුඳුනාපිටිය දක්වා දිවෙන මාර්ගය දැඩි ලෙස අබලන් වී ඇති බවත්;

(ii) එම හේතුවෙන් ප්‍රදේශවාසීන් විශාල පිරිසක් අපහසුතාවට පත්වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් මාර්ගය පිළිසකර කිරීමට පියවර ගන්නා දිනය කවරේද;

(ii) ඒ සඳහා වැයවන මුළු මුදල කොපමණද;

(iii) එම මාර්ගය පිළිසකර කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන නිදහස් කිරීමට කටයුතු කරන දිනය කවරේද;

(iv) මෙම මාර්ගය පිළිසකර කිරීම අවසන්කර ජනතාව අතට පත්කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?